**පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

---

පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය (සුබඅ) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2013 මැයි 08 දින එළඹි අංක එස්ආර්අයි 43576 දරන ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) (ii) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ඉහත සඳහන් ව්‍යාපෘති ගිවිසුම යටතේ 2013 මැයි 08 දින එළඹි අංක 2892 එස්ආර්අයි සහ 2893 එස්ආර්අයි දරන ණය ගිවිසුම් අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 - කොටස සිට 06 - කොටස දක්වා කොටස් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වගකීම දරන අතර ව්‍යාපෘතියේ 07 කොටස ක්‍රියාත්මක කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගකීම දරයි. ව්‍යාපෘතියේ 01 -කොටස සිට 06 - කොටස දක්වා කොටස් යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳ නිරික්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්තිය සැපයීම වැඩිකිරීම හා විදුලිබලය බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය හා විශ්වාසවන්තභාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 25,240 කට සමාන එජඩො මිලියන 200 ක් වන අතර ඉන් රු.මිලියන 16,595.30 කට සමාන එජඩො මිලියන 131.50 ක් හෙවත් සියයට 66 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, පසුව ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය 2019 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා

ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

### 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම හැර, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 2.2.1 නොසැසඳූ ශේෂ

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, රු.මිලියන 7,100.57 ක් වූ මුළු ණය මුදල 2016 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2016 දෙසැම්බර් 31 දිනට අනුරූපී ණය මුදල එකතුව රු.මිලියන 6,968.53 ක් විය.

(ආ) තවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද හා ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.මිලියන 5,014.12 ක් වූ වියපැහැදම් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.මිලියන 5,013.68 ක මුදල සමඟ එකඟ නොවුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 131.50 | 16,595.30 | 10,389.00 | 33.58 | 5,014.00 | 46.62 | 6,969.00 |
| ශ්‍රීලංර | 68.50 | 8,644.70 | 331.00 | - | - | - | - |
| ලංවිම | - | - | 991.00 | 3.77 | 530.00 | 8.63 | 1,289.00 |
| එකතුව | 200.00 | 25,240.00 | 11,711.00 | 37.35 | 5,544.00 | 55.25 | 8,258.00 |

2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 50 ක් ඉකුත්වීමෙන් පසුවත් ණය යටතේ වෙන්කරන ලද මුදල්වලින් සියයට 42 ක් පමණක් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, ඉතිරි කාලපරිච්ඡේදය තුළදී වෙන්කරන ලද සම්පූර්ණ ණයමුදල උපයෝජනය කිරීමේ හැකියාව සැකසහිතව පැවතුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ සංරචකය යටතේ මන්නාරම ග්‍රිඩ් උප පොළහි වැඩබිම සමීක්ෂණය හා පාංශු පරීක්ෂාව, අනුරාධපුර සිට වවුනියා දක්වා නව විදුලිබල සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම් කාර්යය සඳහා ඉදිකිරීමට සැලසුම් කරන ලද විදුලි කණු 372 කින් විදුලි කණු 52 ක්ඉදිකිරීම සහ වෙනත් කණු 169 ක අත්තිවාරම් දැමීමේ වැඩ 2016 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි.

(ආ) ඉඩම් අත්පත් කරගැනීම හා ප්‍රවේශ පහසුකම් ලබාගැනීමේදී ඇති වූ ආරාවුල් හේතුවෙන් සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම යටතේ ක්‍රියාත්මක කරන ලද කෑගල්ල ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම් වැඩ, තුල්හිරිය ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම සහ පාදුක්ක සිට අතුරුගිරිය හා තුල්හිරිය සිට කෑගල්ල දක්වා සම්ප්‍රේෂණ රැහැන් සංවර්ධනය කිරීම ඉලක්කයන්ට පසුපසින් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කරන ලද ප්‍රතික්‍රියා විදුලිබල කළමනාකරණය (Reactive Power Management) සංරචකය යටතේ පන්නල, බෝලවත්ත, බියගම හා හොරණ ග්‍රිඩ් උපපොළවල් සඳහා බ්‍රේකර්ස් ස්විච් (Breakers Switch) සවිකිරීමට මූලික අනුමැතීන් හා කම්හල් පරීක්ෂණ 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මකව පැවති අතර සපුගස්කන්ද ග්‍රිඩ් උපපොළට අදාළ වැඩ 2016 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිවිල් වැඩවල නිරත කොන්ත්‍රාත්කරුවන් මඟින් මෝටර් වාහන ප්‍රසම්පාදනයන් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වල හා ව්‍යාපෘති පරිපාලන අත්පොතේ විධිවිධානයන් නොමැති වුවද රු.මිලියන 436.96 ක පිරිවැයකට එවැනි අයුරින් මෝටර් වාහන 47 ක් ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කර තිබුණි. එම මෝටර් වාහන රු.මිලියන 352.81 ක පිරිවැයකට ඍජුවම ආනයනය කළ හැකිව තිබූ බව නිරීක්ෂණය විය. තවද, රු.මිලියන 402.95 ක් වටිනා මෝටර් වාහන 45 ක් කොන්ත්‍රාත්කරුගේ නමින් ලියාපදිංචි කර තිබුණි.

(ආ) ප්‍රදේශයේ වර්තමානයේ පවතින වෙළඳපල වටිනාකමට ඉතා වැඩි මුදලකට එනම් මාසිකව එක් නිවසකට රු.350,000 බැගින් වූ රේටයට කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, පොතුවිල්, අක්කරෙයිපත්තු හා කිරිබත්කුඹුර ප්‍රදේශවල නිවාස 5 ක් කුලියට ලබාගැනීම මත කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.මිලියන 35.87 ක ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් මඟින් ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන 11 ක් වෙනුවෙන් මාසික ධාවන සටහන් වෙනුවට වැඩබිම් ඉංජිනේරුවන් විසින් සහතික කරන ලද ගමන් සටහන් පත්‍ර ඉදිරිපත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු.මිලියන 40.73 ක ඉන්ධන හා නඩත්තු පිරිවැය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හා පිළිගැනීමට නොහැකි විය.

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් සඳහා සපයන ලද ජංගම දුරකථන 08 ක මාසික කුලිය හා ඇමතුම් ගාස්තු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ව්‍යාපෘතිය විසින් වියදම් දැරීමට ගෙවූ එකතුව රු.මිලියන 2.68 කට අදාළ බිල්පත් නොමැති වීම නිසා විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

සැලසුම්ගත කාලය තුළ ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ණය සපයන ලද නියෝජිතායතනය විසින් 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 61.18 ක බැඳීම් ගාස්තු අයකර ගෙන තිබුණි.